# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


2012-10-06

## මාධ්‍ය නිවේදනයයි.

දැනට ශ්‍රී ලංකාවේ සිටින සේවා නියුක්තිකයින් ප්‍රධාන වශයෙන් කාණ්ඩ දෙකකි. එනම් පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය වේ. මෙයින් රාජ්‍ය සේවයේ නියුතු සේවකයන්ගේ වැටුප්, වැටුප් කොමිසම මඟින් නියාමණය කරනු ලැබේ.

රාජ්‍ය සේවක වැටුප් පිලිබඳ, රාජ්‍ය වැටුප් ප්‍රතිපත්තිය 2006 වර්ෂයේදී නිර්මාණය කොට එළි දක්වන ලදි. මේ අනුව රාජ්‍ය වැටුප් කොමිෂන් සභාව මඟින් වැටුප් නිර්ණය කිරීමේදී මූලික සිද්ධාන්ත මත පදනම් වූ ඉතාමත් විද්‍යානුකූල ක්‍රමයක් මඟින් වැටුප් තීරණය කරනු ලැබේ.

උදාහරණයක් වශයෙන් වෘත්තීමය සුදුසුකම්, රාජකාරි ස්වාභාවය, අවදානම, වගකීම් ආදිවූ ඉහළ නිර්ණායක යොදා ගනිමින් සියලුම රාජ්‍ය සේවකයන් නියමිත වැටුප් තලයන්හි පිහිටුවා ඇත. ඒ අනුව රාජ්‍ය සේවයේ නියතු පහළම සේවා කාණ්ඩයේ සිට ඉහළම සේවා කාණ්ඩය දක්වා විනිශ්චයකාරවරු, වෛද්‍යවරුන්, ඉංජිනේරුවරුන්, ආචාර්යයවරුන් , ගුරුවරුන් ආදි වු සියලුම රාජ්‍ය සේවකයන් නියමිත වැටුප් තලවල පිහිටුවා ඇත. නමුත් දැනට රාජ්‍ය සේවය තුළ පහළම සේවා කාණ්ඩයෙත් ඉහළම සේවා කාණ්ඩයෙත් වැටුප් අනුපාත 1:4 සීමාව තුල පිහිටුවා ඇත.මේ අනුව 1:4 වැනි කුඩා වැටුප් අනුපාතයක් යටතේ විශාලවූ වැටුප් තල ප්‍රමාණයක් පිහිටුවීම නිසා රාජ්‍ය සේවයේ සියලුම අංශ වල වැටුප් වල අර්බුදකාරී තත්වයක් පැන නැඟී ඇත.

මෙම කරුණු රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පසුගිය අවුරුදු ගණනාව තුල නැවත නැවතත් පෙන්වා දෙන ලද අතර, මුදල් අමාත්‍යංශය, රාජ්‍ය වැටුප් කොමිසම සමඟ පැවති සාකච්ඡා වලදී එම ආයතනද 1:4 අනුපාතය වැටුප් අර්බුදයට මූලික හේතුව ලෙස හඳුනා ගන්නා ලදි. මේ අනුව රාජ්‍ය සේවයේ මෙම වැටුප් අර්බුදය විසඳීම සඳහා වැටුප් අනුපාතය 1:12 තෙක් ගෙන යෑම ඉතාමත් සාර්ථක පිලියමක් බව මුදල් අමාත්‍යංශය මෙන්ම වැටුප් කොමිසමද ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගන්නා ලදි.

උදාහරණයක් වශයෙන් ලෝකයේ වෙනත් රටවල වැටුප් අනුපාතය 1:12 වඩා වැඩි අගයක් ගන්නා අතර අසල් වැසි ඉන්දියාවේද රාජ්‍ය සේවයේ වැටුප් අර්බුදය සාර්ථක ලෙස විසඳගනු ලැබුවේ 1:12 වැටුප් අනුපාතයක් රාජ්‍ය සේවය තුල ස්ථාපිත කිරීම මගිනි. ඒ අනුව මුළු රාජ්‍ය සේවයටම බලපාන සාධාරණ විසඳුමකට යාමකින් තොරව දේශපාලනික වුවමනාවන් මත යම් යම් කාණ්ඩ වලට හෝ අංශ වලට සුවිශේෂී ලෙස සලකමින එක් පිරිසකගේ වැටුප් ප්‍රශ්ණය විසඳීමට යාම මෙම අර්බුදය තවත් තීව්‍ර කිරීමක් මිස විසඳුමක් නොවන බව අප සංගමයේ විශ්වාසයයි.

ඒ අනුව සියළුම රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප් ප්‍රශ්ණය විසඳීමකින් තොරව එක් කාණ්ඩයකට පමණක් සුවිශේෂී ආකාරයෙන් සැලකීම සිදුවුව හොත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වීම නොවැලැක් විය හැකි බව අවධාරණය කිරීමට කැමැත්තමු.

ස්තූතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වැඩිදුර විස්තර: වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය නවීන් ද සොයිසා 0718582444